**#mediaethicsSL #SinhalaPress #lka #Divaina**

නිරවද්‍ය භාවය යනු වාර්තාකරණයේදී අනිවාර්යයෙන්ම සැලකිලිමත් විය යුතු මාධ්‍ය ආචාර ධර්මයක් පමණක් නොව, වාර්තාකරණයේ අනිවාර්ය කොන්දේසියක්ද බව නොකිවමනායි. එනිසා යම් කිසි ප්‍රවෘත්තියක් පළ කිරීමට පෙරාතුව එය බහු මූලාශ්‍ර ඔස්සේ තහවුරු කර ගැනීම ඇතුළුව, ප්‍රවෘත්තියක හෝ ලිපියක අඩංගු කරුණු වල නිරවද්‍යතාවය ආරක්ෂා කරගනු වස් සාධාරණ ප්‍රයත්නයක් ගැනීම අනිවාර්ය වේ.

දිවයින පුවත්පතේ පළ වූ මෙම ප්‍රවෘත්තිය ගත් විට, එහි නිරවද්‍යතාවයේ ගැටළු ඇතිවීමට හේතුව මෙම යුගයේ සාමාන්‍ය දෙයක් බවට පත්ව ඇති මූලික තාක්ෂණික දැනුමේ හිඟතාවය විය හැක. විදෙස් පුවතක් විදෙස් බසකින් පරිවර්තනය කිරීමට යාමේදී ඉහත කී දැනුමේ ගැටළුව නිසා මෙම ප්‍රවෘත්තිය විකෘති වී ඇති බව සිතීමට හැක. කෙසේ හෝ දිවයින ඇතුළු ඕනෑම පුවත්පතක්, නිරවද්‍යතාවයෙන් යුතුව කරුණු ඉදිරිපත් කිරීම උදෙසා වැඩිමනත් සැලකිල්ලක් දැක්විය යුතු යැයි අපි පවසමු.